දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ
කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණය සඳහා වන බඳවාගැනීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
යොමු අංකය : DDD/HO/AD/02B/SOR/MN1 — දිනය : 2014.12.03

1.2 අමාත්‍යාංශය : ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
යොමු අංකය : MED/AD/Ei/14/Cader/Vol II — දිනය : 2014.12.29

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය : DMS/1284 — දිනය : 2014.11.19

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :
යොමු අංකය : EST/03/05REC/12106 — දිනය : 2015.02.27

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : NPC/01/22/103/SR — දිනය : 2015.11.30

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :
යොමු අංකය : PSC/EST/05-01-22/12/2014 — දිනය : 2015.12.17

02. පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

03. සේවා ගණය පිළිබඳ විස්තර :

3.1 සේවා ගණය : කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (ඛණ්ඩ 2)

3.2 ශ්‍රේණි : III , II, හා I

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයන්හි විධායක හා පරිපාලන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණික ස්වභාවයේ නොවන්නා වූ ද, ඒකල ස්වරූපයේ වූ ද (single function) කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම සේවා ගණයේ කාර්යයන් අතුරින් පත් කිරීම් බලධාරියා විසින් විශේෂයෙන් නියම කොට දක්වන ලද කාර්යයන් මෙම නිලධර ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය: ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN 01- 2006 A

5.2 වැටුප් පරිමාණය : 13,120-10 x 145 – 11 x 170 – 10 x 240 – 10 x 320 – 22,040

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

ශ්‍රේණිය	ආරම්භක වැටුප් පියවර	ආරම්භක වැටුප් තලය (රු.)
III	පියවර 01	රු. 13,120
II-	පියවර 12	රු. 14,740
I	පියවර 23	රු. 16,680

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් ;

අනුමත තනතුරු නාම	තනතුරු අනුමත ශ්‍රේණිය	අනුමත තනතුරු සංඛ්‍යාව	කාර්යයන්
දිවිනැගුම සංවර්ධන නිලධාරි	III, II, I	27,437	ග්‍රාමීය මට්ටමේදී අර්ථලාභීන් පිළිබඳව දත්ත තොරතුරු එක්රැස්කිරීම හා ප්‍රාදේශීය මට්ටමින් ඉදිරිපත් කිරීම, ව්‍යවසාය සංවර්ධනය හා සේවා ඉතිරි කිරීම, ණය හා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතීන් අර්ථලාභීන් වෙත සම්පාදනය උදෙසා කටයුතු කිරීම, අර්ථලාභීන් සම්බන්ධ ප්‍රජාමූල සංවිධාන ඇතිකිරීම , ඒවාට මඟපෙන්වීම හා නියාමනය කිරීම, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කෘෂිකර්ම, සත්ත්ව පාලන, ධීවර, කර්මාන්ත, සමාජ සුබ සාධන හා වෙනත් සියලුම ආදාන සේවා අර්ථලාභීන් වෙත ලබාදීම, ව්‍යාපාරයේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම උදෙසා කලාපීය , ප්‍රාදේශීය හා ජාතික මට්ටමට අවශ්‍ය තොරතුරු වාර්තා කිරීම. තනතුරට අදාලව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි.

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 1. දිවිනැගුම සංවර්ධන නිලධාරි - 27,437

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කිරීමේ කාර්යය සඳහා III, II, හා I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවක් සේ සැලකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

ධාරාව	ප්‍රතිශතය
විවෘත	100%
සීමිත	-
කුසලතා	-

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

විවෘත බඳවා ගැනීම : (අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාල නොවේ.

7.2.2.3 පළපුරුද්ද : අදාල නොවේ.

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විම.
ii. විශිෂ්ට චරිතයකින් යුක්තවිය යුතුය.
iii. තනතුරට බඳවාගැනීම සඳහා 7.2.2 හා 7.2.3 සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට ගැසට් නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින් එම සුදුසුකම් සම්පූර්ණ කළයුතුය.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 30 ට නොවැඩි

7.2.4 බඳවාගැනීමේ ක්‍රමය :

7.2.4.1 ලිඛිත විභාගයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මඟින්

විෂයයන්	උපරිම ලකුණු	සමත් ලකුණු
1.අභියෝග්‍යතාව	100	40%
2.සමාජ සංවර්ධනය පිළිබඳ සාමාන්‍ය දැනීම	100	40%

විෂය නිර්දේශය අමුණා ඇත. (ඇමුණුම 01)

7.2.4.1.1 පවත්වන ලබන බලධරයා : දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්.

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්ණ පත්‍ර දෙකෙන්ම සමත් ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් අතුරින් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහිදී 7.2.2 හා 7.2.3 ට අදාලව සුදුසුකම් පරීක්ෂා කර බලා ඒ අනුව අයදුම්කරුවන් බඳවාගනු ලැබේ.

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර	උපරිම ලකුණු	සමත් ලකුණු ප්‍රමාණය
1.අතිරේක අධ්‍යාපන සුදුසුකම්	30	අදාල නොවේ
2.පළපුරුද්ද	50	
3. වෘත්තීය සුදුසුකම්	15	
4. සම්මුඛ පරීක්ෂණයේදි දක්වන ලද කුසලතාවය	05	

සටහන්

01. ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්ණ පත්‍ර දෙකෙන්ම සමත් ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් අතුරින් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහිදී ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සහ ලිඛිත පරීක්ෂණයේදි ලබා ගත් ලකුණු වල මුළු එකතුවෙන් කුසලතා අනුපිළිවෙල අනුව 7.2.2 හා 7.2.3 ට අදාලව සුදුසුකම් පරීක්ෂා කර බලා ඒ අනුව අයදුම්කරුවන් බඳවාගනු ලැබේ.

02. සවිස්තරාත්මක ලකුණු පරිපාටිය බඳවාගැනීම් සඳහා අයදුම්පත් කැඳවන අවස්ථාවේදී දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ පලකරනු ලැබිය යුතුය.

7.2.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම හා වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මඟින් .

7.3 සීමිත බඳවාගැනීම් : අදාල නොවේ.

7.4 කුසලතා පදනම මත බඳවාගැනීම : අදාල නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග	කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද	කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/සහතික පත්‍ර පාඨමාලා/ වෙනත්
01 වන කාර්යක්ෂමතා කඩඉම	III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගත වීමට පෙර	ලිඛිත පරීක්ෂණයක්
02 වන කාර්යක්ෂමතා කඩඉම	II වන ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වසර 03ක් ගත වීමට පෙර	ලිඛිත පරීක්ෂණයක්
03 වන කාර්යක්ෂමතා කඩඉම	I වන ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වසර 05ක් ගත වීමට පෙර	ලිඛිත පරීක්ෂණයක්

(විෂය නිර්දේශය - ඇමුණුම අංක 02,03,04)

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට-අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද:

1 වන කාර්යක්ෂමතා කඩඉම - දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මඟින්.

2 වන කාර්යක්ෂමතා කඩඉම - දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මඟින්.

3 වන කාර්යක්ෂමතා කඩඉම - දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මඟින්.

09. භාෂා ප්‍රවීණතාව

9.1

භාෂාව	ලබා ගත යුතු ප්‍රවීණතාව
1. රාජ්‍ය භාෂාව	රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුල දී ලබාගත යුතුය.
2. අනෙක් රාජ්‍ය භාෂාව	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබාගත යුතුය.

10. ශ්‍රේණි උසස් කිරීම

10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම:

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම

ii. සේවා ගණයේ III වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටියට අනුව උසස් කිරීම් දිනට පෙරාතුව වූ වසර (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලයේදී ලබාගෙන තිබීම

vi. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනයට සමත්වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත අදාල නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම:

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව :

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක (10) උපයාගෙන තිබීම.

ii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. අනුමත කාර්යසාධනය ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය නියමිත කාලය තුළ ලබා ගෙන තිබීම.

v. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාල නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම : අදාල නොවේ.

11. තනතුරු වලට පත් කිරීම : අදාල **නොවේ.**

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ

කොන්දේසි : අදාල නොවේ.

13. සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුලත් නොවන , එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුලත් , නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම: **ඇමුණුම 05**

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධි විධාන අදාල වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරණු ලැබේ.

17. අන්තර් කාලීන විධිවිධාන

17.1 අන්තර් කාලය මෙම බඳවාගැනීමේ පරිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දින සිට 2016.12.31 දක්වා බල පැවැත්වේ.

17.2 අන්තර් කාලීන විධිවිධාන යටතේ බඳවාගැනීම

2013 අංක 01 දරණ දිවිනැගුම පනත අනුව ඒකාබද්ධ කරන ලද ආයතන වල 2013.01.11 දිනට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30(1) මගින් ලබාදී ඇති MA1-1 වැටුප් පරිමාණය යටතේ සේවයේ නියුක්තව සිටි 2013 අංක 01 දරණ දිවිනැගුම පනතෙහි 44 (ඉ) (iii) වගන්තිය අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයට එක්වීමට මනාපය පලකරනු ලැබ ඇති සමෘද්ධි සංවර්ධන නිලධාරීන් , සේවයට බඳවාගනු ලබන දිනට උපරිම වයස අවු. 45 නොඉක්මවීමේ කොන්දේසියට යටත්ව අන්තර් කාලය තුලදී සේවයට බඳවාගනු ලැබේ.

සකස් කළේ :
අත්සන : [signature]
නම : ආර්. එම්. එන්. ටී. ආර් රත්නායක
තනතුර : පී. එල්. ඕ.
දිනය : 2016.12.18

පරීක්ෂා කළේ :
අත්සන : [signature]
නම : ඒ.බී.ටී. පී. ගුණරත්න
තනතුර : ස.අ (පාලන)
දිනය : 2016.12.18

නිර්දේශ කර ඉදිරිපත් කරමි.
අත්සන : [signature]
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : චන්ද්‍රා වික්‍රමසිංහ
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
නිල මුද්‍රාව: දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව [illegible] 04 වන මහල, සෙත්සිරිපාය [illegible] බත්තරමුල්ල

[signature]

යොමු අංකය : MSS/ADM/DN-01-15

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 (MN–01-2006A) සඳහා වන බඳවා ගැනීම් හා උසස්කිරීම් පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :

නම :

ලේකම්,

සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය

දිනය : 13/12

නිල මුද්‍රාව : මහින්ද සෙනෙවිරත්න
ලේකම්
සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන
අමාත්‍යාංශය
01 වන මහල, සෙත්සිරිපාය - II අදියර
බත්තරමුල්ල.

යොමු අංකය PSC/EST/05-01-22/12/2014

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සඳහා වන බඳවා ගැනීම් හා උසස්කිරීම් පරිපාටිය 2015.12.17 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන :

නම :

ලේකම්,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

දිනය : 2015.12.30

නිල මුද්‍රාව :

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

ඇමුණුම 01.

III ශ්‍රේණියට බඳවාගැනීම (විවෘත) සඳහා වන ලිඛිත පරීක්ෂණය

01. විභාගයේ නම : දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ (MN-01-2006A) දිවිනැගුම සංවර්ධන නිලධාරීන් III ශ්‍රේණියට බඳවාගැනීම (විවෘත) සඳහා වන ලිඛිත පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

ප්‍රශ්න පත්‍රය	කාලය	මුළු ලකුණු	සමත් ලකුණු
1. අභියෝග්‍යතාව	පැය 01	100	40%
2. සාමාජ සංවර්ධනය පිළිබඳ සාමාන්‍ය දැනුම	පැය 01	100	40%

03. විභාගය පවත්වනු ලබන බලධරයා : අධ්‍යක්ෂ ජනරාල්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය පරිදි

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

ප්‍රශ්න පත්‍රයේ නම	විෂයය නිර්දේශය
1.අභියෝග්‍යතාව	පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය සහ බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.
2.සාමාජ සංවර්ධනය පිළිබඳ සාමාන්‍ය දැනුම	ග්‍රාමීය හා ජාතික මට්ටමේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම අප සමාජය තුළ පවතින සමාජයීය, සංස්කෘතික, ආර්ථික හා අනෙකුත් සමාජ සංවර්ධනයන්ට අදාල සාධක පිළිබඳ අපේක්ෂකයා සතු දැනුවත්භාවය සහ අවබෝධය මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

සකස් කළේ :
අත්සන : [signature]
නම : ආර්.එම්.එන්.ඒ.එන්. රත්නායක.
තනතුර : ප්‍ර.කළ.ස.
දිනය : 2015.12.18

පරීක්ෂා කළේ :
අත්සන : [signature]
නම : ඩබ්.කේ.ආර්. ගුණරත්න
තනතුර : ස.අ.(පාලන)
දිනය : 2015.12.18

අත්සන : [signature]
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : අධ්‍යක්ෂ ජනරාල්
තනතුර : දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව 04 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
නිල මුද්‍රාව :

ඇමුණුම 02

01වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. විභාගයේ නම : දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ (MN– 01-2006A) දිවිනැගුම සංවර්ධන නිලධාරීන් සඳහා වන 01සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

ප්‍රශ්න පත්‍රය	කාලය	මුළු ලකුණු	සමත් ලකුණු
1.ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා කාර්යාල ක්‍රම	පැය 03	100	40%
2.දිවිනැගුම සංවර්ධන පනත හා ජීවනෝපාය සංවර්ධනය සඳහා රජයේ ප්‍රතිපත්ති	පැය 03	100	40%

03. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා : අධ්‍යක්ෂ ජනරාල්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂයය නිර්දේශය :

ප්‍රශ්න පත්‍රයේ නම	විෂයය නිර්දේශය
1. ආයතන සංග්‍රහය හා කාර්යාල ක්‍රම	රජයේ කාර්යාලවල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව ද රාජකාරි ලිපිලේඛන මැනවින් අවබෝධ කොටගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහනක් මඟින් තම අදහස් / නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝග අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව පරීක්ෂා කෙරේ. 2009.02.20 දිනැති අංක 1589/30 දරණ කාර්ය පරිපාටික රීති , ආයතන සංග්‍රහයේ VII, XII, XIV, XXIV පරිච්ඡේද පිළිබඳ දැනුම.
2. මුදල් රෙගුලාසි	රජයේ කාර්යාල වල භාවිතා වන මූලික ගිණුම් හා මුදල් පාලන පොත්වල කාර්ය පිළිබඳ අවබෝධය හා දැනුම මැන බැලීම අපේක්ෂා කෙරේ. රෙගුලාසි අංක 119 124 සිට 128 133 හා 134 154 සිට 156 168 177 හා 178 343

3. දිවිනැගුම සංවර්ධන පනත හා ජීවනෝපාය සංවර්ධන සඳහා රජයේ ප්‍රතිපත්ති	දිවිනැගුම සංවර්ධන පනතේ සඳහන් විධිවිධාන, ප්‍රජා මූල බැංකු, ග්‍රාමීය සංවර්ධනය සඳහා ආයතන්වය, ග්‍රාමීය සංවර්ධනය සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන දෙපාර්තමේන්තුව හා අනෙකුත් රාජ්‍ය ආයතනවල කාර්යභාරය

සකස් කළේ :
අත්සන : ....
නම : ආර්.එම්. එන්.ඩී.ආර්. රත්නායක
තනතුර : [illegible]
දිනය : 2015.12.18

පරීක්ෂා කළේ :
අත්සන : ....
නම : ඒ.බී.ආර්. කුමාරරත්න
තනතුර : ස.ද (පාලන)
දිනය : 2015.12.18

අත්සන : ....
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ....
තනතුර : ....
නිල මුද්‍රාව : ....

චන්ද්‍රා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
[illegible]
බත්තරමුල්ල.

ඇමුණුම 03

02 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. විභාගයේ නම : දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ (MN– 01-2006A) දිවිනැගුම සංවර්ධන නිලධාරීන් සඳහා වන 02 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර

ප්‍රශ්න පත්‍රය	කාලය	මුළු ලකුණු	සමත් ලකුණු
1. ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි	පැය 03	100	40%
2. දිවිනැගුම සංවර්ධන පනත හා දිවිනැගුම් සංවර්ධනයට අදාල රජයේ ප්‍රතිපත්ති ජීවනෝපාය සංවර්ධනයට අදාල නව ප්‍රතිපත්ති	පැය 03	100	40%

03. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා : අධ්‍යක්ෂ ජනරාල්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂයය නිර්දේශය :

ප්‍රශ්න පත්‍රයේ නාම	විෂයය නිර්දේශය
1. ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි	ආයතන සංග්‍රහයේ I හා II කොටස්වල අඩංගු විධිවිධාන පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.
2. දිවිනැගුම සංවර්ධන පනත හා සමාජ සංවර්ධනයට අදාල රජයේ ප්‍රතිපත්ති ජීවනෝපාය සංවර්ධනයට අදාල නව ප්‍රවණතා	දිවිනැගුම් සංවර්ධන පනතේ විධිවිධාන , ප්‍රජාමූල සංවිධාන, ප්‍රජා මූල බැංකු, අලෙවි අංශයන්හි කාර්යභාරය, දිවිනැගුම සංවර්ධනය හා සම්ගාමී අනෙකුත් රාජ්‍ය ආයතනවල කාර්යභාරය. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා ජීවනෝපාය අංශයේ දායකත්වය, ජීවනෝපාය සංවර්ධනයේ වැදගත්කම,වර්තමානයේ පැන නගින ගැටළු.

යකත් කළේ :
අත්සන : ....
නම : ආර්.ඩබ්.ආර්.ඒ.ආර් රත්නායක.
තනතුර : නි.අධ්‍ය.ජ.
දිනය : 2015.12.18

පරීක්ෂා කළේ :
අත්සන : ....
නම : ඩී.කේ.එච්. ගුණරත්න
තනතුර : නි.අ (පාලන)
දිනය : 2015.12.18

අත්සන : ....
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : චන්ද්‍රා වික්‍රමසිංහ
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
නිල මුද්‍රාව: දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව 04 වන මහල, සෙත්සිරිපාය බත්තරමුල්ල.

03 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. විභාගයේ නම : දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2සේවා ගණයේ (MN– 01-2006A) දිවිනැගුම සංවර්ධන නිලධාරීන් සඳහා වන 03 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02. විභාගය පිළිබඳ විස්තර :

ප්‍රශ්න පත්‍රය	කාලය	මුළු ලකුණු	සමත් ලකුණු
1.කාර්ය විශේෂිත දැනුම	පැය 01 1/2	100	40%
2.විෂයය අනුබද්ධිත අධ්‍යයනය	පැය 01 1/2	100	40%

03. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා : අධ්‍යක්ෂ ජනරාල්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂයය නිර්දේශය :

ප්‍රශ්න පත්‍රයේ නම	විෂයය නිර්දේශය
1.කාර්ය විශේෂිත දැනුම	පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන්හි විෂයය නිර්දේශයන්ට ඇතුළත් කරුණු පිළිබඳ අදාල නිලධාරියාගේ දැනුම හා කුසලතාවයන් ඔහුගේ ජ්‍යෙෂ්ඨත්වයට සරිලන පරිදි වැඩි දියුණු වී තිබේද යන්න හා ගතවූ කාලය තුළ එහි ක්ෂේත්‍රයන්හි සිදුව ඇති නව්‍යකරණයන් පිළිබඳව දැනුවත් වී තිබීම පිළිබඳ මැන බැලීම.
2.විෂයය අනුබද්ධිත අධ්‍යයනය	කාර්ය පරිපාලනයට අදාළ වන ගැටළුවකට ගතයුතු ක්‍රියාමාර්ග විභාග වන පරිදි බහුවරණ ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයීම.

සකස් කළේ :
අත්සන :
නම : ආර්.ඩබ්.එල්.ඒ.එන්. රත්නායක
තනතුර : පි.සං.නි.ස.
දිනය : 2015.12.18

පරීක්ෂා කළේ :
අත්සන :
නම : අයි.ඊ.ඩී. ගුණරත්න
තනතුර : ස.අ.(නි.වි.)
දිනය : 2015.12.18

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම :
තනතුර :
නිල මුද්‍රාව:
විකුමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
4 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

ඇමුණුම 05

<u>සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම.</u>

2013 අංක 01 දරණ දිවිනැගුම පනත අනුව ඒකාබද්ධ කරන ලද ආයතන වල 2013.01.11 දිනට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30(1) මඟින් ලබාදී ඇති MA1-1 වැටුප් පරිමාණය යටතේ සේවයේ නියුක්තව සිටි 2013 අංක 01 දරණ දිවිනැගුම පනතෙහි 44 (ඉ) (ii) වගන්තිය අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයට එක්වීමට මනාපය පලකරනු ලැබ ඇති සමෘද්ධි සංවර්ධන නිලධාරීන් මෙම බඳවාගැනීමේ පරිපාටිය අනුමත දින සිට ක්‍රියාත්මක වන ලෙස සේවා කාලය මත පදනම්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගතයුත්තේ ඒ ඒ තනතුරට පත්කරන ලද දිනය පදනම් කරගෙනය. එසේ වුවද , අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල නිලධාරියාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවන අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවැති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක වියයුතුය. එසේම සේවා කාලය මත පදනම්ව වැටුප් පියවර තීරණය කලයුතුය.

<u>(I) MN-01–III වන ශ්‍රේණිය</u>

(අ) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 මඟින් ලබා දී ඇති MA-1-1 වැටුප් පරිමාණය යටතේ III වන ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහයක (10) සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්,

(ආ) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 මඟින් ලබා දී ඇති MA-1-1 වැටුප් පරිමාණය යටතේ III වන ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහයක (10) සේවා කාලයක් සම්පූර්ණ වුවද II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්,

MN-01 – III වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

<u>(II) MN-01–II වන ශ්‍රේණිය</u>

(අ) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 මඟින් ලබා දී ඇති MA-1-1 වැටුප් පරිමාණය යටතේ III වන ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහයකට (10) වැඩි එහෙත් අවුරුදු විස්සකට (20) අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුළ වැටුප් වර්ධක දහයක් (10) උපයා ගෙන ඇති නිලධාරීන්.

(ආ) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 මඟින් ලබා දී ඇති MA-1-1 වැටුප් පරිමාණය යටතේ II වන ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක අවම වශයෙන් අවුරුදු දහයක (10) සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්,

(ඇ) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 මඟින් ලබා දී ඇති MA-1-1 වැටුප් පරිමාණය යටතේ II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු 10ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබුනාද උසස් කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්,

MN-01 – II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(III) MN-01–I වන ශ්‍රේණිය

(අ) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 මගින් ලබා දී ඇති MA-1-1 වැටුප් පරිමාණය යටතේ III වන ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක අවම වශයෙන් අවුරුදු විස්සක් (20) හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුළ වැටුප් වර්ධක විස්සක් (20) ක් උපයා ගෙන ඇති නිලධාරීන්,

(ආ) ඉහත සඳහන් පරිදි II වන ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක අවම වශයෙන් අවුරුදු දහයක් (10) හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුළ වැටුප් වර්ධක දහයක් (10) ක් උපයා ගෙන ඇති නිලධාරීන් ,

(ඇ) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 මගින් ලබා දී ඇති MA-1-1 වැටුප් පරිමාණය යටතේ I වන ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක් දරන නිලධාරීන්,

MN-01 - I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සකස් කළේ :
අත්සන :
නම : ආර්. එම්. එන්. ඩී. එස්. රත්නායක
තනතුර : අ. නි. ස.
දිනය : 2015.12.18

පරීක්ෂා කළේ :
අත්සන :
නම : [illegible]
තනතුර : [illegible]
දිනය : 2015.12.18

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : චන්ද්‍රා වික්‍රමසිංහ
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
නිල මුද්‍රාව: 04 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.